# සහෝදරියෝ.



පි.සනුති සෙහන්සා.

# සහෝදරියෝ.

පි.සනුති සෙහන්සා

කතෘගේ වෙනත් කෘති - ආඩම්බර සමනළයා

තරාදුට හොඳ පාඩමක්

ISBN 978-624-97022-0-2

~~~~~ පිදුම ~~~~~

ග්‍රන්ථකරණයට මා පොළඹවමින් එහි මූලික අඩිතාලම ශක්තිමත්ව සකසා දුන් මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනිය ඇතුළු ගුරු මෑණිවරුන් පියවරුන්ටත්,

ඒ සඳහා මා ඔසවා තබා නිරන්තර දිරිය දුන් දෙමාපියන්ටත් මේ කෘතිය සෙනෙහසින් පුදමි.

~~~~~~~~~~

## පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණිය යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝදමත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදී කතෘ කරදන අත්ථදස්සී මාහිමිපානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණ ගත්කරණී** "ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි

ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලාතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සදහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමයා බාලිකා විද්‍යාලය - මහනුවර

ඔන්න එක ගෙදරක සහෝදරියෝ දෙදෙනෙක් හිටියා. මේ දෙන්නගෙන් ලොකු අක්කා කියුටි. නංගි මියුටි. හැබැයි මේ දෙන්නා අක්කයි නංගියි වුනාට ගතිගුණ, හැසිරීම අතින් එක වගේනම් නෙවෙයි. දෙන්නට දෙන්නා අහසයි පොළවයි වගෙයි.

කියුටි නිතරම ගෙදරින් වගේම පාසලේ ගුරුවරුන්ගෙන් බැනුම් අහන කෙනෙක්. ඒකට හේතුව තමයි එයා කිසිම වැඩිහිටියෙකුගේ කීමක් අහන්නේ නැතිව හිතුවක්කාර කමින් දවස ගත කිරීම. ගෙදරදී වගේම පාසලේ දී ත් හරිම දඟයි.

"කියුටී....... දුවේ......,

පාඩම් වැඩ කරන්ඩ." මේ අම්මයි තාත්තයි කියුටිට නිතරම කියන දේ.

නමුත් කියුටි කළේ එයාට ඕන දේ විතරයි. මුළු දවසම ගෙව්වෙ ටීවී බලන්නයි ගේම් ගහන්නයි. ඒ වගේම එයා යාහළුවන්ගේ සාද වලට ගිහින් විනෝද වෙන්නත් හරිම කැමතියි.



මියුටි කියුටිගේ නංගි. එයා ඉගෙනීමේ වැඩ වලට හරිම දක්ෂයි. පන්තියේ හැමදාම පළවෙනියා වෙන්න මියුටිට පුළුවන් වුණා. අක්කා ආදර්ශයට අරන් නංගිත් නරක කෙනෙක් වෙයි කියලා අම්මයි තාත්තයි ලොකු බයකින් හිටියේ.

මියුටි හැමදාම පන්තියේ වැඩිම ලකුණු ලබාගෙන තෑගි ගත්තා. තරඟවලින් දිනලා තෑගි ගත්තා. අම්මා නිතරම නංගි වගේ වෙන්න කියලා කියුටි ට කියන නිසා කියුටි නංගිට ආදරේ කළේ නෑ. එයත් එක්ක නිතරම රණ්ඩු කළා. පාඩම් වැඩ වලට බාදා කළා. හැබැයි නංගි එහෙම නෑ. අක්කට හරිම ආදරෙයි.

දවසක් කියුට්ට යාළුවෙක් සාදයකට ආරාධනා කළා. හැබැයි ඒක තිබුනේ ඉස්කෝලේ තියෙන දවසක. අම්මගෙන් අවසර ගන්න ලේසි වෙන එකක් නෑ කියලා කියුටි දැන ගෙන හිටියා.

එදා රෑ කෑම කන වෙලාවෙ කියුටි මේ ගැන අම්මගෙන් අහන්න හිතුවා.

" අම්මේ... "

"ඇයි පුතේ.. "

" අම්මේ, හෙට මගේ හොඳම යාළුවගේ උපන්දින පාටිය. මට ඒකට යන්න ඕනි"

" කොහෙද තියෙන්නේ පුතේ? කීයට ද තියෙන්නෙ ? "

" ටවුන් එකේ ලියාරා හෝටලයේ අම්මේ. උදේ 10.00 වෙද්දි යන්න ඕනි"

" කවද්ද තියෙන්නෙ ? " ඒක අහගෙන නිශ්ශබ්දව හිටපු තාත්තා ඇහුවා.

" හෙට තාත්තේ "

" හෙට ඉස්කෝලෙ දවසක්. ඉස්කෝලෙ නොගිහින් පාටිවලට යන්නේ නෑ. අනික හෝටල්වලට පොඩි ළමයි තනියම යන්නෙ නෑ." තාත්තා සැරෙන් වගේ කිවුවා.

" අනේ මට යන්නම ඕනි..... යන්නම ඕනි.... " කියුටි බිම පෙරළි පෙරළී අඩන්න පටන් ගත්තා.

" ඔයා මේ මාසේ යාළුවන්ගේ පාටි දෙකකට ගියා මට මතකයි. ආයේ ඔයාට පාටිවලට යන්ඩ තහනම්. " තාත්තා තරහෙන් නැගිටලා ගියා.

තාත්තාගේ ස්වරූපය දිහා බලපු මියුටි තාත්තට හොදටම තරහ ගිහින් කියලා දැන ගත්තා.

" අක්කේ, ඔයා ඔහොම අඩලා කරදර කරලා ජය ගන්ඩ ගියොත් තාත්තට තවත් තරහ යයි. ඔයාට කවදාවත් පාටිවලට යන්ඩ දෙන්නෙ නැති වෙයි. වෙන කොහේවත් යන්ඩ දෙන එකකුත් නෑ" නංගි කිව්වා.

" මට ඉස්කෝලෙ යන්ඩ බෑ. මට පාටියට යන්ඩ ඕනි"

" ඔයා හැමදාම ඉස්කෝලෙ ගිහින්, මේ සැරේ වාර විභාගයට හොදට ලකුණු ගත්තොත් දෙහිවල සත්තුවත්ත බලන්ඩයි වෝර්ටර් වර්ල්ඩ් එකේ සෙල්ලම් කරන්ඩ එක්ක යන්ඩ කියලා මම තාත්තිව පොරොන්දු කරව ගන්නවා. අක්කේ ඔයා කැමතිද? "

" ආ.... මං ආසයි වතුරෙ සෙල්ලම් කරන්න. මගේ යාළුවොත් සත්තුවත්ත ගැන කියල තියෙනවා. ඒකෙ අපිට නිතර දකින්ඩ නැති සත්තු ගොඩාක් ඉන්නවලු. "

දැන් කියුටි වෙනද වගේ නෙමෙයි. හැමදාම ඉස්කෝලෙ යනවා. ගුරුතුමී දෙන ගෙදර වැඩ නංගිත් එක්ක එකතු වෙලා කරනවා. නංගි ඉගෙනීමට දක්ෂ නිසා අක්කට අමාරු ගණිතය පාඩම් කියල දෙන්න හරිම ආසාවෙන් ඉදිරිපත්වුණා.

පාඩම් වැඩ නිම වී කියුටි සහ මියුටි නින්දට ගියා.

අක්කා සහ නංගී එක වගේ ඇඳුමින් සැරසී ගමනට අවශ්‍ය වතුර, කෙටි කෑම, තොප්පි ගමන් බෑග්වල අසුරා පිටෙහි එල්ලාගෙන ගමනට සූදානම් වුණා. සත්තු වත්තේ විවිධ සත්තු නැරඹීමෙන් අනතුරුව මොවුන් අලි සෙල්ලම් ද බැලුවා. දැන් තමා කියුටි ආසම ආස තැනට යන වෙලාව. ඒ වෝටර් වර්ල්ඩ්. කියුටි වට පිට බැලුවා. වතුරේ ලිස්සල යන්ඩ පුලුවන් ලස්සන තැනක් තිබුණා. කියුටි නංගිත් ඇදගෙන එතනට දිව්වා. දෙන්නත් එක්ක වතුරට බැස්සා.



ඒත් එක්කම කියුටි ගැස්සිලා ඇහැරුණා. ඇදේ ඉද ගත්ත කියුටි මොකදවුනේ කියලා කල්පනා කළා.

" මං ඒ දැක්කේ හීනයක් ද?

අනේ ඒක හැබෑ වෙනව නම් " කියුටිට හිතුණා.

කියුටි වෙලාව බැලුවා. පාන්දර 4.00 යි. එයා මූණ ටිකක් හෝදගෙන පාඩම් කරන්න පටන් ගත්තා. නංගිත් පාඩම් කරන්ඩ එකතු වුණා.

කුස්සියේ උයමින් සිටි අම්මා කාමරයට එබිලා බැලුවා. කියුටි පාඩම් කරනවා දැකලා අම්මා පුදුම වුණා. දැන් හැමදාම උදෙන්ම නැඟිටලා දෙන්නම පාඩම් කරනවා. ඉස්සර නිතර ගේම් ගහන, කාටූන් බලන කියුටිගේ මේ වෙනස නිසා අම්මයි තාත්තයි ප්‍රශංසා කළා. ආශිර්වාද කළා.

අවසන් වාර පරීක්ෂණය පැවැත්වෙන දිනය ලගා වුණා. හැමදාම දිනයට නියමිත ඉගෙනීම් කටයුතු නිම කිරීමට කියුටි පුරුදුවෙලා හිටිය නිසා එයාට අමුතුවෙන් පාඩම් කරන්න දෙයක් තිබුනේ නෑ. වැඩ ගොඩගැහිලා තිබුනෙත් නෑ. සැහැල්ලුවෙන් විභාගයට මුහුණ දුන්නා.



අද දෙසැම්බර් 31. හෙට අලුත් වසරේ අලුත් පන්තියට යන දවස. දැන් උදෑසන රැස්වීමේ ආගමික කටයුතු අවසන් වීමෙන් පසු විදුහල්පතිතුමියගේ කතාව යි.

එතුමියගේ කතාවේ අවසන්බාගය........

"දැන් අපි මෙවර වාර විභාගයේ ලකුණු ඉදිරිපත් කරන්නයි ලෑස්ති. මෙම ශ්‍රේණියේ ප්‍රථම ස්ථාන............ කියුටි භාග්‍යා විජේරත්න දියණියයි. "

දස අතින් නැඟුණු අත් පොළසන් හඬ මැද්දේ කියුටි යුහුසුලුව වේදිකාව වෙත දිව ගියාය.

ඇය සිසුන් අතර දෑස් එහෙ මෙහෙ කරකවන්නට විය .ඒ දෙනෙත් මියුටි ලඟ නතර විය.

~~~ නිමි ~~~
~~~

## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරුපසක් සැකසීම සමාජ වගකීමයි

පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය දියණියන් ගුරුභවතුන් දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්

වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණීය යුගයේ ස්මාට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි තම නිර්මාන ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න මහලේකම්